## පාසල් ළමුන් සඳහා ආහාර ලබා දීමේ රජයේ පෝෂණ වැඩසටහන - 20…..
## පළාත්/ කලාප සම්බන්ධීකරණ නිලධාරීන් පත් කිරීම

................................................................ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ/ කලාප අධ්‍යාපන කාර්යාලයේ සේවය කරන ......................................................... වන ඔබ පාසල් ළමුන් සඳහා ආහාර ලබා දීමේ රජයේ පෝෂණ වැඩසටහනෙහි සම්බන්ධීකරණ නිලධාරියකු ලෙස පත් කර ඇති බව සතුටින් දන්වා සිටිමි.

එමෙන් ම වැඩසටහන නියාමනය කිරීමේ දී පහත සඳහන් ක්ෂේත්‍ර නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ දැයි සොයා බැලීම සඳහා විශේෂ අවධානය යොමු කළ යුතු ය.

- ශිෂ්‍ය සංඛ්‍යාවල නිරවද්‍යතාව
- ලබා දී ඇති ආහාර වට්ටෝරු අනුව ආහාර ලබා දීම
- නියමිත වේලාවට ආහාර සැපයීම
- ආහාර ලබා ගැනීමට පෙර හා පසු සබන් දමා අත් සේදීම
- වැඩසටහනට අදාළව පාසල විසින් පවත්වා ගත යුතු ලිපි ලේඛන පවත්වාගෙන යාම
- දෙනු ලබන ආහාර වේල්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මක බව තහවුරු කිරීම
- සෞඛ්‍යවත් ලෙස පාසල් පරිසරය පවත්වාගෙන යාම
- සිසුන් තුළ හොඳ ආහාර පුරුදු හා සෞඛ්‍ය පුරුදු ප්‍රවර්ධනය
- සනීපාරක්ෂක හා ජල පහසුකම් වල ප්‍රමාණාත්මක බව /පිරිසිදු බව හා ඒවා භාවිතය හා නඩත්තු කිරීම
- අපද්‍රව්‍ය ඉවත දැමීමේ ක්‍රමවේද

තව ද වැඩසටහන නියාමනය කිරීමේ දී ඉහත සඳහන් ක්ෂේත්‍ර නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ දැයි සොයා බැලීමත්, වැඩසටහන නියාමනය සඳහා සැලසුම් සකස් කිරීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම හා වාර්තා පවත්වාගෙන යාම, මූලා ප්‍රගති වාර්තා සකස් කිරීමට සහාය වීම, වාර්තා නියමිත දිනට පිළියෙල කර අදාළ අංශවලට යොමු කිරීම අනිවාර්යය වන අතර, වැඩසටහන ක්‍රියාත්මක වීම පිළිබඳ සොයා බලා ගැටලු නිරාකරණය කර ගැනීමට පියවර ගැනීම, වැඩසටහන නිසි පරිදි පවත්වා ගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබා දීම හා මග පෙන්වීමත්, පවතින තත්ත්වය පිළිබඳ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා අදාළ අංශ වෙත තොරතුරු ලබා දීමත්, කලාප/ පළාත් නියාමන වාර්තා සෑම වාරයකට ම වරක් ලබා දීමත් , මූලා ප්‍රගතිය පිළිබඳ සාරාංශ වාර්තාව සෑම මසකම 20වන දිනට පෙර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දීමට හා පෝෂණ වැඩසටහනට අදාළ සියලු තොරතුරු සෞඛ්‍ය ප්‍රවර්ධන දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමත්, ඔබගේ වගකීම වේ.

...............................................

කලාප /පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

දිනය :